| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/14/13/Emp. | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2025.10.08. |
|---|---|---|---|---|---|

සියළුම / දිස්ත්‍රික් ලේකම්වරු/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,

සියළුම නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂවරුන් /සහකාර සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම සමෘද්ධි කළමණාකරුවන්,

සියළුම විෂය භාර නිලධාරින් / සමෘද්ධි සංවර්ධන නිලධාරින්.

**ප්‍රජා සවිබලගැන්වීම් වැඩසටහන යටතේ හඳුනාගත් අස්වැසුම ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමය හඳුන්වාදීම.**

ප්‍රජා සවිබලගැන්වීම් වැඩසටහන යටතේ, අස්වැසුම සමාජ ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සහ සමෘද්ධි සහනාධාර ලැබූ (දැනට අස්වැසුම නොලබන) ප්‍රතිලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභී පවුල් 2,000,000 සවිබලගැන්වීම සඳහා සැලසුම් සකස් කර 2025 වර්ෂයට අදාල වැඩසටහන් දැනට දිස්ත්‍රික්ක හා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් දියත්කරමින් පවතී. තවද ආසියානු සංවර්ධන බැංකු හා ලෝක බැංකු මූල්‍යාධාර වැඩසටහන් යටතේ නියමු ව්‍යාපෘති දෙකක් ද ක්‍රියාත්මකව පවතී.

02. එමෙන්ම මේ වන විටත් සකස් කර ඇති ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ග ඇසුරින්, රටතුල සමස්ථ ලෙස සමාජ ආරක්ෂණ පද්ධතියක් ගොඩනැගීම සඳහා වූ දස අවුරුදු සැලැස්මට (2025 – 2035) අදාල අමාත්‍ය මණ්ඩල තීරණය 2025.09.23 දින ප්‍රකාශයට පත්කර ඇති අතර, මෙම යොජිත විශ්‍රාම වැටුප් ක්‍රමවේදය තුල එයට යම් දායකත්වයක් සපයනු ඇත.

03. පංචවිධ ක්‍රමවේදයට අනුව සවිබලගැන්වීම් සංකල්පය හඳුන්වාදී ඇති අතර එහි එක් ප්‍රධාන ධාරාවක් වන්නේ මෙම ප්‍රතිලාභීන් සඳහා සුදුසු සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම වේ.

04. මේ සම්බන්ධයෙන් අප අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ඊට මැදිහත්ව කටයුතු කරන අතර, ඒ සඳහා අමාත්‍යාංශය මඟින් ද උපදෙස් ලබාදී ඇත.

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |

05. සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින්, ක්‍රියාත්මක දායක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සවිබලගැන්වීම් වැඩසටහන තුල හඳුනාගත් ප්‍රතිලාභී පවුල් සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කෙරේ.

06. මෙම වැඩසටහන යටතේ, අස්වැසුම ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් (නියමු ව්‍යාපෘතියට ඇතුලත් ප්‍රතිලාභීන් සමඟ) සහ සමෘද්ධි සහනාධාර ලැබූ (දැනට අස්වැසුම නොලබන) ප්‍රතිලාභී පවුල් ඇතුලත් අඩු ආදායම්ලාභී පවුල් ඉලක්ක පවුල් වන අතර, ඔවුන් වයස්ගත තත්ත්වයට පත්වන විට මුහුණ දෙනු ලබන විවිධ දුෂ්කරතාවයන්ට යම් සහනයක් ලබාගැනීමට හැකිවන අයුරින් මෙම දායක විශ්‍රාම වැටුප් ක්‍රමවේදය ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මඟින් හඳුන්වා දී ඇත.

07. ඊට අදාලව ඔවුන් විසින් ඉදිරිපත් කර ඇති සංෂිප්ත ව්‍යාපෘති වාර්තාව තුල ස්ව කැමැත්ත මත මෙම විශ්‍රාම වැටුප් ක්‍රමවේදයට දායකවිය හැකි ආකාරය පිළිබඳව ද තොරතුරු ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාවේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.

08. ඒ අනුව, මේ වන විට හා ඉදිරියේදී අප දෙපාර්තමේන්තුව මඟින් දීප ව්‍යාප්තව සිදු කරනු ලබන මෙම සවිබලගැන්වීම් වැඩසටහනට ඇතුලත් වන සියළුම ප්‍රතිලාභීන් මේ පිළිබඳව දැනුවත් කර සමාජ ආරක්ෂණ දායක විශ්‍රාම වැටුප් ක්‍රමයේ ඇති වැදගත්කම පහදාදීම අප සැමගේ රාජකාරිමය වගකීමක් වනු ඇත.

09. එමෙන්ම, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික්ක වල කටයුතු කරන එම නිලධාරීන් මෙම දායක විශ්‍රාම වැටුප් ක්‍රමයට ප්‍රතිලාභීන් බඳවා ගැනීම සිදු කරන අතර, ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, ග්‍රාම නිලධාරී වසම් වල සේවයේ නියුතු නිලධාරීන්ගේ අනිවාර්යය කටයුත්තක් සේ සලකා කටයුතු කරන මෙන් ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

සී.ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-
1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. සාමාන්‍යාධිකාරී,ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
3. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපා. - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපා. - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.